# මාතලේ ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද , ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 08 දින සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මාතලේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.152,500 ක මුද්දර ගාස්තු ආදායම වර්ෂයේ ආදායමට බැරකරනු වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ආ). දෙවැනි ප්‍රජාජල ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු රු.79,950 ක් වටිනා බජාජ් වර්ගයට අයත් යතුරු පැදියේ වටිනාකම හා යුද්ධ හමුදාව වෙත රැගෙන ගොස් ආපසු භාරදී තිබුණු අංක 53-4727 දරන කැබ්රථයේ වටිනාකම ගිණුම් ගතකර නොතිබණි.

(ඇ). 2012 ජුලි 25 දින සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සභාවේ භෞතිකව නොමැති රු.41,462 ක් වටිනා කසල කරත්ත 03 ක් ගිණුම්වල ඇතුළත් කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2012 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 03 කට පිළිතරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.9,274,011 ක් විය.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.449,832 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,572,165 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,083,182ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ විදේශ ගමන් අත්තිකාරම් රු.327,367 ක ශේෂය තුල 2008 ට පෙර සිට පැවත එන රු.310,367 ක ශේෂ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 99 රීතියට පටහැනිව සමාලෝචිත වර්ෂයට අදාල රු.1,291,873 ක් වටිනා වවුචර් 61 ක් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (ආ) ජේදය පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම වෙනුවෙන් එක් අවස්ථාවකදි ගෙවිය හැකි උපරිම සීමාව රු.20,000 ක් වුවත්, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 04 දී එකතුව රු.124,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371(2)(ඇ) ඡේදය පරිදි දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ වහාම පියවිය යුතු වූවත්, 2005 සිට 2008 වර්ෂය දක්වා අවස්ථා 07 කදී දෙන ලද රු.310,367 ක අත්තිකාරම් 2012 ජනවාරි 26 දින වන විටත්, පියවා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මගින් වෙන්කර තිබුණු රු.5,700,000 ක්වූ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක ප්‍රතිපාදන කිසිදු වියදමක් නොදරා මාරුකිරීම හෝ ඉතිරි කිරීම කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 930 | 1,040 | 641 |
| (ii) බදු කුලී | 3,681 | 177 | 16 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,085 | 2,185 | - |
| (iv) වෙනත් ආදායම් | 26,836 | 30,217 | 9,227 |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,062,431 |
| (ii). | මුද්දර ගාස්තු | 2,421,315 |

2.3.3 ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දනට අයවීමට තිබුණු රු.4,743,752 ක්වූ හිඟ ජල ගාස්තු ශේෂය තුළ වසර 05 කට වැඩි කාලයක සිට අයවීමට තිබුණු හිඟ ජල ගාස්තු ශේෂය රු.2,576,987 ක් විය.

2.3.4 වරිපනම් හා අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් හා අක්කර බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා අක්කර බදු ශේෂය පිළිවෙලින් රු.468,538 ක් හා රු.172,680 ක් විය.

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.774,590 ක්වූ භෞතික සම්පත් විෂයයන් 17 ක් නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (1) වගන්තියට අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් 32ක් ආදේශක පදනම මත බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප් ලෙස රු.3,956,078 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.6 අවිධිමත් ගණුදෙනු

(අ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 3.4 හා 6.3 හා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207 හා 208 රීතියට පටහැනිව පොදු තරඟකාරී පදනමක් අනුගමනය කිරීමකින් තොරව අත්මිළ ගණන් ලබාගෙන සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 12 කදී රු.1,498,204 ක මිලදී ගැනීම් හා අළුත්වැඩියාවන් කර තිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 114 රීතියේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව අලුත්වැඩියාවට අදාල කිසිදු වැඩ කොටසක් ඉටු නොකර තිබියදී ජේ.සි.බි. යන්ත්‍රයේ අළුත්වැඩියාව වෙනුවෙන් 75% ක අත්තිකාරමක් ලෙස රු.102,946 ක් සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි.

(ඇ). මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ හා 2002 ජුලි 25 දිනැති අංක සිපීසී/සිඑස්/9/4/1/6/55 දරන ලිපිය ප්‍රකාරව වාහනයේ අලුත්වැඩියාවන් සතුටුදායකව සිදුකළ බවට අදාළ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාවක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී රු.210,567 ක් වාහන අලුත්වැඩියාවන් සඳහා ගෙවා තිබුණු අතර, අලුත්වැඩියාවේදී ගලවා ඉවත් කරන ලද සියලුම උපාංග හා ගලවා ඉවත් කරන ලද ටයර්, ගබඩාවට භාරදී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබියදී වාහන අමතර කොටස් හා ටයර් මිළදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී රු.577,367 ක් වැයකර තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

රු.6,233,559 ක ඇස්තමේන්තුවකට අනුව, 2010 ජූලි 10 දින වැඩ ආරම්භ කළ වල්ලිවෙල ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු 2011 ජනවාරි 12 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇතත්, 2011 දෙසැම්බර් 31 දින වන විටත්, අදාල ප්‍රතිපාදන නොලැබීම නිසා වැඩ අවසන් කර නොතිබුණු අතර, එදිනට දරා ඇති පිරිවැය රු. 3,250,893 ක් විය.

2.8 හඳුනාගත් පාඩු හා හානි

------------------------------

2011 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, සභාව සතු පලාපත්වල මහජන පුස්තකාලයේ රු.8,769 ක් වටිනා පුස්තකාල පොත් 75 ක් හා ප්‍රාදේශීය සභා කාර්යාලයේ වටිනාකම ගණනය නොකළ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 288 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ). 2001 සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ විවිධ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මධ්‍යම පළාත් සභාව හා මාතලේ ප්‍රාදේශීය ලේකම් වෙතින් සභාවට ලැබිය යුතුව තිබුණු රු.1,306,000 ක මුදලක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ). 2004 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල රු.724,643 ක ණය හිමි ශේෂ 59 ක් නිරවුල් කර නොතිබුණි.

(ඇ). සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.110,732 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතෙ 21 වගන්තිය ප්‍රකාරව අනුමත සැලසුම් මත ඉදිකරන ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අනුමත කළ අයදුම්පත් 308 න් 05 ක් සඳහාද , පසුගිය වර්ෂයේදි අනුමත කළ අයදුම්පත් 232 න් 06 ක් සඳහා ද,

පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණු අතර, ඉතිරි ඉල්ලුම්පත් සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ආදායම් පරිපාලනය

(ආ). අයවැය පාලනය

(ඇ). ණයගැති හා ණයහිමි පාලනය

(ඈ). තොග පාලනය